# අෂ්ටඵලරුහ, දෙතිස්ඵලරුහ බෝධීන් හා එහි ව්‍යාප්තිය පිළිබඳ සමාලෝචනයක්

කුඩාවැවේ සෝමානන්ද හිමි

## හැඳින්වීම

ගෞතම බුදුරජාණන් වහන්සේගේ ජීවන චරිතය හා සම්බන්ධිත උත්තරීතර පූජනීය ස්ථාන හතරක් පිළිබඳ බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙයි. එනම් සිද්ධාර්ථ කුමාරයා උත්පත්තිය ලැබූ සාලවනය, සම්මා සම්බුද්ධත්වය අවබෝධ කරගත් ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිහිටි බුද්ධගයාව, ප්‍රථම ධර්ම දේශනය පැවැත් වූ පුදබිම වූ සාරානාථයේ ඉසිපතන මිගදාය මෙන්ම බුදුරජාණන් වහන්සේ අනුපදිශේෂ මහා පරිනිර්වාණයට පත් වූ කුසිනාරාවෙහි මල්ල රජ දරුවන්ගේ සාලවනය යන පූජනීය ස්ථානයන්ය. මෙහි දෙවැනි ස්ථානය වශයෙන් සඳහන් වන්නේ බුද්ධත්වය ලැබූ තැනයි. එනම් ගයාවේ පිහිටා ඇති ශ්‍රී මහා බෝධි වෘක්ෂ මූලයයි. මෙහි පූජනීයභාවය හේතුකොට ගෙන බෝධිරෝපණය බෙහෙවින්ම ව්‍යාප්ත වූ අතර එය බෝධි සංකල්පයේ ප්‍රවර්ධනය කෙරෙහි ද අතිශයින්ම බලපාන ලදි. භාරතීය ඉතිහාසය මෙන්ම බෞද්ධ සිද්ධස්ථාන සම්බන්ධයෙන් පෙරදිග මෙන්ම අපරදිග විද්වතුන් විසින් සිංහල, ඉංග්‍රීසි සහ වෙනත් භාෂාවලින් ලියූ ශාස්ත්‍රීය පොතපත ඉතා විශාල සංඛ්‍යාවක් දැකිය හැකිය. බුදුරජාණන් වහන්සේගේ උත්පත්ති දේශය පිළිබඳ ඓතිහාසික යථා තත්ත්වය ඉතිහාසඥයින් හා පුරාවිද්‍යාඥයන් විසින් තහවුරු කර තිබේ. බුද්ධගයාව මහාබෝධිය ආදි ස්ථාන ගැන ඒ. කනිංහැම්, බිනිමාදබ් බරුවා, ඩී. කේ. බරුවා වැන්නන් මේ සම්බන්ධයෙන් පර්යේෂණාත්මක ග්‍රන්ථ රචනා කොට ඇති බව පෙනෙයි.

## බෝධි සංකල්පය හා එහි ඓතිහාසික පසුබිම

බෝධි යන්නෙන් ව්‍යවහාර වන්නේ අශ්වත්ථ ඇසතු හෙවත් ඇහැටු පවුලට අයත් ගසකි. එහි විද්‍යාත්මක නාමය වන්නේ FICUS RELIGIOSA වශයෙනි. මෙම පවුලට අයත් වන වෘක්ෂ කිහිපයක්ම

උද්භිද ලෝකයේ දී හමුවෙයි. සිද්ධාර්ථ ගෞතම බෝසතාණන් වහන්සේ විසින් බුද්ධත්වයට පත්වන අවස්ථාවේ වැඩසිටීම උදෙසා තෝරාගනු ලැබුවේ මෙම ඇසතු ගස්වලින් එකකි. එම වෘක්ෂය යට හිඳ බුද්ධත්වය හෙවත් ශ්‍රේෂ්ඨ වූ ඥානය - බුද්ධිය ලබාගත් නිසාම එම වෘක්ෂය ද එකල සිට බෝධි නාමයෙන් හැඳින්විණි. මීට පෙර බෝධි නාමයෙන් වෘක්ෂයක් නොවුණි. මෙම වෘක්ෂය බෞද්ධයන් අතර පූජාර්හ වස්තුවක් බවට පත්වූයේ ද මෙම ඓතිහාසික සිද්ධිය මුල්කරගෙනය. එහෙත් ඇසතු වෘක්ෂය පූජාර්හ වස්තුවක් වශයෙන් මීට පෙර බොහෝ කාලයකට පෙර සිටම සැලකිල්ලට ලක් වී තිබිණි. මෙහි ඉතිහාසය මොහෙන්ජදාරෝ හරප්පා ශිෂ්ටාචාරයන් දක්වාම ඇතට දිවයන බව පුරාවිද්‍යාත්මක සාක්ෂි සනාථ කරයි. හරප්පා ශිෂ්ටාචාරයේ ඇති මුද්‍රාවක ඇසතු වෘක්ෂයක සිටින අං සහිත දෙවඟන, අං ඇති තවත් රූපයකින් වැඳුම් ලබන අයුරු දැකිය හැකිය.[1] ඍග්වේද යුගයේ දැක්වෙන්නේ ඇසතු ගස දෙවිවරුන් වාසය කළ දේවායතනයක් වශයෙනි.[2] එසේම ඇසතු ගස බ්‍රාහ්මණ, ආරණ්‍යයක, උපනිෂද්, මහාකාව්‍ය, වීරකාව්‍ය සහ පුරාණ යන සෑම අවස්ථාවකදී ම බෙහෙවින්ම පූජාවට ලක්වීමත් අවසානයේ දී දේවත්වයෙන් ම සැලකූ බව ඉහත සඳහන් ග්‍රන්ථ තුළින් සාධක සොයා ගැනීමට හැකිය. පුරාණ යුගය වනවිට ඇසතු ගස නිසැක වශයෙන් ම ප්‍රත්‍යක්ෂ විෂ්ණු දෙවියන් වශයෙන් පත් වී ඇත. නැවත බ්‍රහ්ම, විෂ්ණු හා මහේශ්වර යන ත්‍රිමූර්තියේ එකම සංකේතය බවට ද පත් වී තිබේ.[3]

## බෞද්ධ සාහිත්‍යයෙහි නිරූපිත ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ

මෙවැනි පසුබිමක් යටතේ ඇසතු ගස සිද්ධාර්ථ ගෞතම බෝසතාණන් වහන්සේ විසින් ස්වකීය බෝධිය වශයෙන් තෝරාගෙන ඇති හෙයින් එහි අර්ථ රාශියක්ම ගැබ් වී ඇතැයි සිතීමට අවකාශ සලසා දෙයි. එසේම දෙව්රම් වෙහෙරේ ආනන්ද බෝධියක් රෝපණය කිරීමත් එය බුදුරදුන්ගේම යැයි ද බුදුරදුන්ගේ නිබඳ වාසයකියි ද ජාතකට්ඨකථාව දක්වයි.[4] ගයාවේ ශ්‍රී මහා බෝධියෙන්ම ලබාගත් බීජයකින් එම බෝධිය රෝපණය කරන ලදි. බුද්ධත්වයෙන් අනතුරුව දෙවැනි සතියේ දී බුදුරදුන් විසින්ම පැවැත් වූ අනිමිසලෝචන පූජාවෙන් බුද්ධත්වය ලබාගන්නා අවස්ථාවේ දී තමන්ට සෙවණත් සිසිලසත් ලබා දුන් එම වෘක්ෂයට ස්වකීය කෘතඥතාව පළ කර සිටියහ.

ආනන්ද බෝධිරෝපණය කර ඇත්තේ යටකී පරිදි බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරේ නැති අවස්ථාවන්හි උන්වහන්සේ වෙනුවට නියෝජනය කරමින් පෙනී සිටින ජීවමාන බුද්ධ සංකේතයක් ලෙසය. ඒ සඳහා බුදුන් වහන්සේ තරමටම එහි වටිනාකම උසස් තත්ත්වයක තබා ඇතැයි පෙන්වා දිය හැකිය. එලසමවතින් නැගී සිටිය බුදුරජාණන් වහන්සේ එම බෝධිය උන්වහන්සේගේ නිබඳ වාසස්ථානයක් යැයි පළ කළහ.[5] එහෙයින් ආනන්ද බෝධිය බුදුරජාණන් වහන්සේගේ ජීවමාන සංකේතයක් බවට පත්විය. ඉහත සඳහන් කළ පරිදි බුද්ධත්වය ලබා ගැනීමේ අවස්ථාවේ දී වැඩසිටීම, අනිමිසලෝචනය, ආනන්දබෝධිරෝපණය යන කරුණු නිසා බෝධිය සැබෑම බුද්ධ සංකේතයක් විය. මෙලෙස වර්ධනය වූ බෝධිරෝපණ ක්‍රියාවලිය භාරතයෙහි ව්‍යාප්ත වී ගියේය. ආනන්ද කුමාරස්වාමි මහතා භාරතයේ සෑම විහාරයකම බෝධිය අනිවාර්ය අංගයක් වූ බව පෙන්වා දෙයි.[6] සාංචි බුද්ධගයා ආදී ස්ථානයන්හි දැකිය හැකි ගල් ගරාදි වැටවල මෙන්ම වෙනත් ඉපැරණි කැටයම්හී ද බෝධිවෘක්ෂ හා මලසුන් ගෙවල්වල සටහන් දැකිය හැකියි.[7]

බුද්ධ පරිනිර්වාණයෙන් ශතවර්ෂ කිහිපයක් යන තෙක්ම බුද්ධ ප්‍රතිමා නෙළීමක් සිදු වී නොමැත. ඉපැණි ථෙරවාදී බෞද්ධ සාහිත්‍යයේ බුදුරජාණන් වහන්සේ රූප ස්වභාවයෙන් දැක්විය නොහැකි බවත් අප්පටිම හෙවත් ප්‍රතිමාවට නැගිය නොහැකි බවත් අච්ඡරිය මනුස්ස හෙවත් ආශ්චර්යමත් මිනිසෙකු බවත් අනූපමේය හෙවත් උපමාවකින් දැක්විය නොහැකි ශාස්තෘවරයෙකු යැයි දැක්වෙයි.[8] මහායාන දර්ශනයේ බුදුන් වහන්සේ ශූන්‍ය දෙයක් වශයෙන් සැලකෙන හෙයින් උන්වහන්සේ රූපකායෙන් ගෙනහැර දැක්වීමට නොහැකිය.[9] තවද බුදුන් වහන්සේ අද්විතීය, අප්‍රතිමය, අසමසම යැයි අංගුත්තර නිකායේ දැක්වෙයි.[10] එසේම උන්වහන්සේ තුළ විද්‍යමාන වූ ශීල සමාධි ප්‍රඥා ආදි ගුණාංග,[11] දෙතිස්මහා පුරුෂ ලක්ෂණ,[12] අසීත්‍යනුව්‍යඤ්ජන ලක්ෂණ ආදිය ගැන බෞද්ධ සාහිත්‍යයෙහි දක්නට ලැබේ. එහෙයින් අසදෘශ, අසමසම, නිෂ්පුද්ගල ලොව්තුරා බුදුන්වහන්සේ පුද්ගලානුරූපයෙන් ගෙනහැර දැක්වීම මුල්කාලපරිච්ඡේදයේ සිටම බෞද්ධයන්ට වඩාත් ගැටලු සහගත වී තිබේ.[13] ක්‍රි. ව. දෙවැනි ශතවර්ශයේ දී පමණ මථුරා ගන්ධාර සම්ප්‍රදායයන් බිහි වී බුදුපිළිම නෙළීම තෙක්ම බුදුරජාණන් වහන්සේ ගෙනහැර දක්වන අවස්ථාවන්හි යොදා ඇත්තේ ඒ සඳහා

යොදාගත් සංකේතවලින්ය. බෝධිවෘක්ෂය ද එම සංකේතවලින් එකක් වශයෙන් දැක්විය හැකිය.[14] ඉහත සඳහන් කළ පරිදි බුදුන් වහන්සේ වැඩසිටි අවධියේ සිටම බුදුන් වහන්සේ බෝධිය මගින් සංකේතාත්මකව ගෙනහැර දක්වා ඇති බව පැහැදිලිය. එසේම ඉන්පසු අවධිවල දී බෝධි වන්දනය මෙන්ම බුදුන් වහන්සේ බෝධිය මගින් සංකේතාත්මකව ගෙනහැරපෑම බෙහෙවින්ම ජනප්‍රියව තිබූ බව ක්‍රි. පූ. තෙවැනි සියවසේ සිටි අශෝක අධිරාජයාගේ අවධියේ සිට ක්‍රිස්තු වර්ෂාරම්භක කාලය තෙක් වූ අවධියට අයත් වන භාරතීය පුරාවිද්‍යාත්මක සාධක මගින් වඩාත් තහවුරු වී තිබේ.[15] දීඝනිකායේ මහාපරිනිබ්බාන සූත්‍රයෙහි දැක්වෙන පරිදි සැදැහැවතුන්ගේ ප්‍රසාදයටත් සංවේගයටත් හේතුවන්නා වූ ද එම අරමුණු කරගෙන පින් කර ගැනීමට හැකි වන්නාවූ ද ස්ථාන හතරෙන් දෙවැනි ස්ථානය වශයෙන් සඳහන් වන්නේ බුද්ධත්වය ලැබූ ස්ථානයයි.[16] එනම් ගයාවේ පිහිටි ශ්‍රී මහා බෝධි වෘක්ෂ මූලයයි. එම වෘක්ෂ මූලය දැකීමෙන් වැඳීමෙන් පිදීමෙන් සගමොක් සුව ලබාගත හැකි බව බුදුරජාණන් වහන්සේ විසින්ම ප්‍රකාශ කර තිබීම බෙහෙවින්ම වැදගත් වූවකි. මෙය බෝධිරෝපණය බෙහෙවින්ම පැතිරීයාම මෙන්ම බෝධි සංකල්පයේ ප්‍රවර්ධනයටත් අතිශය රුකුලක් විය. මෙවැනි තැන් දැකබලා ගැනීමට ගිය වන්දනා ගමන් පිළිබඳව ද ඉපැරණි වාර්තාවල දක්නට ලැබේ. ඒවා සඳහන් කර ඇත්තේ 'චේතියචාරිකා' නමින්ය. මෙය පූර්වාදර්ශ කරගත් මුල් යුගවල මෙන්ම පශ්චාත් කාලීන යුගයන්හි ද සිව්වනක් පිරිස මෙන් ම පොදු මහජනයා ද චෛත්‍ය, බෝධිය වන්දනා කරමින් ගිය සංචාරක තොරතුරු දක්නට ඇත.[17] සාංචි කැටයම්හි අසෝක අධිරාජයා බුද්ධගයාවේ මහාබෝධිය වන්දනා කරන ආකාරය නිරූපනය කර ඇත්තේ ද එය එම අවධියේ ජනප්‍රිය වූ ආගමික අංගයක් වූ හෙයින්ය.[18]

කිසියම් කෙනෙකු සම්භාවනීය හෝ පූජනීය තත්වයට පත් වූ විට එම පුද්ගලයා වාසය කළ ස්ථාන පරිහරණය කළ දෑ ආදිය කිසියම් ආකාරයකට උසස් තත්වයකට පත්වීම හෝ කෞතුක වශයෙන් හෝ සැලකීම දක්නට ලැබෙන සාමාන්‍ය දෙයක් වශයෙන් සැලකිය හැකිය. ගෞතම බුදුරජාණන් වහන්සේ වැනි ශ්‍රේෂ්ඨ දහමක් මෙලොවට දායාද කළ ශාස්තෘවරයෙකු සම්බන්ධයෙන් සැලකීමේ දී මෙම තත්ත්වය බෙහෙවින්ම අපේක්ෂා කළ යුත්තකි. මහ බෝසතාණන් වහන්සේ සමග එකම දිනයේ උපන් 'සහජාත වස්තූන්'

හතක් සම්බන්ධයෙන් බුද්ධවංසට්ඨකථාවේ දැක්වෙයි.[19] මෙම සහජාත වස්තු ලැයිස්තුවේ ප්‍රථම තැනට බෝධිය ගණන් ගෙන තිබෙයි. මීට පෙර සිටිය බුදුරජාණන් වහන්සේලාට හිමි බෝධි වෘක්ෂ ද ඇතැම් අවස්ථාවල හඳුන්වා දී ඇත. ඉන් පෙනෙන්නේ බෝධි සංකල්පය ඉතා ඈත අතීතයකට සම්බන්ධ බවකි.[20]

බෝධි වෘක්ෂය ඉතාමත් වේගයෙන් පොදු මහජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර විය. ඒ අනුව විවිධ පුදපූජා පැවැත්වීම ආදිය ඉස්මතු වී ඇති අතර එමගින් නිවන් පසක් කර ගැනීම වැනි දෑ සම්බන්ධයෙන් ථෙරථෙරී අපදානයන් මගින් පැහැදිලි කරගත හැකිය.[21] බෝධිය පමණක් නොව ඒ වටා ඇති වැලි මළුව පවා ගෞරවනීය බවින් යුතුව සලකා තිබේ. බෝමළුවට ඇතුළු වන භික්ෂූන් වහන්සේ බුදුරජාණන් වහන්සේ අභිමුව මෙන් සංවරව ඉරියව් පැවැත්විය යතු බව සම්මෝහවිනෝදනිය ගෙනහැර දක්වයි.[22] බුද්ධගයාවේ නේරඤ්ජනා නදිය අසල වූ ඇසතු වෘක්ෂය ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේ බුද්ධත්වය ලැබීම සඳහා පරිහරණය කළ බෝධියයි. ලොව පහළවීමේ දී ප්‍රථමයෙන්ම දර්ශනය වන්නේ මෙම භූමිය බවත් ලෝක විනාශයේදී මහාබෝධිය පිහිටි භූමිය අන්තිමට විනාශ වන බවත් කියවේ. බුදුරජාණන් වහන්සේ බුද්ධගයාවේ දී බුද්ධත්වය ලබා ගැනීමෙන් පස්සේ සති හතක්ම විවිධ ස්ථානයන්හි ධ්‍යාන සමාපත්තියට සමවැද සමාධි සුවයෙන් වැඩ වාසය කළහ. උන්වහන්සේ පළමු සතිය මෙම බෝධි වෘක්ෂය යට වැඩ සිටියහ. බුදුරජාණන් වහන්සේ සම්බෝධියෙන් දෙවැනි සතියේ දී බෝධියට ගරුකිරීමක් වශයෙන් සතියක් අනිමිසලෝචන පූජාව පැවැත්වූහ. මහාබෝධිය බෙහෙවින්ම ගරුසම්භාවනාවට පත් වූ අතර සාමයික භේදයකින් තොරව මහාජනයාගේ පූජාවට පාත්‍ර විය. මෙම බෝධිවෘක්ෂයට කිහිපවරක්ම විවිධ හේතු නිසා හානි පැමිණියේය. භාරතයේ දී ඉහත සඳහන් කළ පරිදි සංවර්ධනය වී පැවැති බෝධි සංකල්පය ශ්‍රී ලංකාවේදීත් බෙහෙවින්ම ගෞරවාදරයට පාත්‍ර වූ පූජනීය වස්තුවක් බවට පත්විය.

## අෂ්ටඵලරුහ බෝධීන්ගේ ව්‍යාප්තිය හා ප්‍රාදේශීය සබඳතා

අෂ්ටඵලරුහ බෝධීන්ගේ ඉතිහාසය දෙස බැලීමෙන් පෙනෙන්නේ බෝරුක් රාශියක්ම ඉතාමත් කෙටිකාලයකින් ලංකාව

පුරා ව්‍යාප්ත වූ බවක්ය. එතුළින් සිදුවූයේ පූජනීය වස්තුවක් වශයෙන් පමණක් නොවෙයි. එවක පැවැති ප්‍රධාන රාජ්‍යයට ප්‍රාදේශීය සබඳතා ඇති කරවන, පොදුජන සහභාගීත්වයක් නැතහොත් සම්බන්ධීකරණ පුරුකක් වශයෙනුත් රුකුලක් වූ බව පැහැදිලිය. ලක්දිවට වැඩමවාගෙන රැගෙන ආ දක්ෂිණ බෝධි ශාඛාවේ නැගෙනහිර පස ඇත්තේ ඵලයකින් හටගත් පැල අටෙකි. එලෙස පළමුවෙන්ම හටගත් පැල අට හැඳින්වෙන්නේ අෂ්ටඵලරුහ නමින්ය. මෙම අෂ්ටඵලරුහ බෝධි රෝපණය කළ ස්ථාන පිළිබඳව මහාවංසය, සමන්තපාසාදිකාව පාලි සිංහල බෝධිවංස වැනි මූලාශ්‍රයන්හි තොරතුරු අනාවරණය කෙරෙන අතර දීපවංශයෙහි අෂ්ටඵලරුහ හා දෙතිස්ඵලරුහ බෝධි ගැන නොදැක්වෙයි. එහි දැක්වෙන්නේ දේවානම්පිය තිස්ස රජු යොදුනෙන් යොදුන විහාරාරාම කරවූ බවක්ය.[23] ඉහත සඳහන් කළ මූලාශ්‍රය ග්‍රන්ථයන්හි අෂ්ටඵලරුහ බෝධි ජම්බුකෝල පට්ටනය, තිවක්ක බමුණුගම් දොර, ථූපාරාමය, කසුප්ගිරි වෙහෙර, ප්‍රථමක චෛත්‍යය, රෝහණයේ කතරගම, රෝහණයේ චන්දනගම යන ස්ථානයන්හි රෝපණය කළ බව දැක්වෙයි. මෙම බෝධිරෝපණ ස්ථාන සම්බන්ධයෙන් අවධානය යොමු කළ විට එවක පැවැති අනුරාධපුර මධ්‍යම රාජ්‍යය හා සම්බන්ධ වූ ප්‍රදේශයන් පිළිබඳව වටහාගත හැකිය. එම ස්ථාන අතුරෙන් ථූපාරාමය, කසුප්ගිරි වෙහෙර, ප්‍රථමක චෛත්‍යය සහ සෑගිරිය යන ස්ථාන හතරම අනුරාධපුර සීමාව ඇතුළත ම පිහිටා තිබේ. ජම්බුකෝලය හෙවත් වර්තමානයේ සම්බිලිතුරෙයි වශයෙන් හඳුනාගෙන ඇති ස්ථානයත් තිවක්ක බමුණුගමත් පිහිටා ඇත්තේ උතුරු ප්‍රදේශයේ යැයි පෙනෙයි. ඉහත සඳහන් කළ ස්ථාන අතුරෙන් කතරගමත් චන්දනගමත් පිහිටියේ රෝහණයේ යැයි පැහැදිලිය. බෝධි ආගමනය සම්බන්ධිත උත්සවය රාජකීය සබඳතා සහිත පැවැත් වූයෙන් තිවක්ක බ්‍රාහ්මණයා, කතරගම හා චන්දන ග්‍රාමයේ ක්ෂත්‍රියයන් යන පිරිස මෙයට සහභාගී වෙන්නට ඇත්තේ විශේෂිත වූ ආරාධිතයන් හැටියට යැයි සිතිය හැකිය.[24] රෝහණයේ සිටි මෙම ප්‍රාදේශීය ක්ෂත්‍රිය පාලකයන්[25] සමග අනුරාධපුර රාජ්‍ය හෝ රජුන් අතර හෝ සබඳතාවයක් සනාථ වෙයි.[26]

**සමාලෝචනය**

ගෞතම බුදුරජාණන් වහන්සේගේ උත්පත්තිය සිදුවූයේත් බුද්ධත්වය ලැබුවේත් පිරිනිවන් පෑවේත් ඉන්දියාවේය. උන්වහන්සේගේ

බුද්ධත්වය සිදුවූයේ ගයාවේදී වන අතර දම්සක් දෙසීම සිදුවූයේ ඉසිපතනයේ දී ය. එහෙයින් බෞද්ධයන්ගේ නොමඳ ගෞරවයක් ඉන්දියාව කෙරෙහි පවතියි. මෙම සියලුම ස්ථානයන්ගෙන් ඉතාම වැදගත් ස්ථානය වන්නේ බුද්ධගයාවයි. එහි පිහිටා ඇති ශ්‍රී මහා බෝධි වෘක්ෂය බුද්ධත්වය ලබාගන්නා අවස්ථාවේ වැඩ සිටීම, අනිමිසලෝචනය, ආනන්ද බෝධිරෝපණය යන කරුණු නිසා සිදු වී ඇත්තේ බෝධිය සැබෑම බුද්ධ සංකේතයක් වීමයි.

## ආන්තික සටහන්

1. ඒ. එල්. බෂාම්, *අසිරිමත් ඉන්දියාව*, කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේනතුව, 1962, පි. 27.
2. *ඍග්වේද මණ්ඩල 10*, ed. Pandurang Jawali, Ni rnaya Sagara Press, Bombay, 1930.
3. *පද්ම පුරාණය*, උත්තර ඛණ්ඩ 160 අධ්‍යාය.
4. *ජාතකට්ඨකථා*, කාලිංගබොධි ජාතකය, විදුරුපොළ පියතිස්ස, කොළඹ: සයිමන් හේවාවිතාරණ ප්‍රකාශනය, පි. 212.
5. *එම*, පි. 212.
6. ආනන්ද කේ. කුමාරස්වාමි, *මධ්‍යකාලීන සිංහල කලා*, කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1992, පි. 119.
7. Debala Mitra, *Buddhist Monuments*, Culcutta: sahitya Samsad, 1980, plates: 11, 64, p. 97.
8. *මනොරථපූරණී*, සංස්. රත්මලානේ ධර්මාරාම හිමි, කොළඹ, 1922, පිටු. 71 - 72.
9. ජම්බුගහපිටියේ ධම්මාලෝක හිමි, *ශ්‍රී ලාංකේය ප්‍රතිමාකරණ සම්ප්‍රදාය*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2021, පි. 20.
10. *අංගුත්තර නිකාය*, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, කොළඹ, පි. 44.
11. *මජ්ඣිම නිකාය*, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, කොළඹ: පළමු භාගය 1964, 164 - 198; කඹුරුපිටියේ වනරතන හිමි, *ලක්දිව බුදුපිළිමය*, මාතර: සීමාසහිත මාතර වෙළෙන්දෝ, 1985, පිටු. 3-4, 54 -58.
12. *දීඝනිකාය*, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, කොළඹ: දෙවන භාගය, 2006, පිටු. 3 - 31.
13. මහින්ද සෝමතිලක, *බුද්ධ ප්‍රතිමාවෙහි ප්‍රභවය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, 2017, පි. 32.

14. Debala Mitra, *Buddhist Monuments, sahitya Samsad*, Culcutta, 1980,plates No 7, 15, 16; Sukumara Dutt,

*The Buddha and Five After Centuries*, Sahitya Samsad, Culcuta, 1980, Plat. 11, 64, p. 97; R.C. Majumdar,

T*he History and Culture of Indian People*, The Age of Impeirial Unity, vol. II, 19960, plates No. xv, xx.

15. A. Cunningham, *Stupa of Bharuth,* London, 1879, pp. 45, 106, 113.

16. *දීඝනිකාය*, මහපරිනිබ්බාන සූත්‍රය, බුද්ධ ජයන්ති ග්‍රන්ථ මුද්‍රණාලය, පි. 86.

17. *සම්මෝහවිනොදනි*, යගිරල ප්‍රඥානන්ද ශෝධනය, සයිමන් හේවාවිතාන ප්‍රකාශනය, 1982, පි. 204.

18. A.L. Srivastava, *Life in Sanchi Sculpture*, Abhiív Publications, New Delhi, 1983, plate no. XVII.

19. *බුද්ධවංසට්ඨකථා*, යගිරල ශ්‍රී ප්‍රඥානන්ද ශෝධනය, කොළඹ: සයිමන් හේවාවිතාන ප්‍රකාශනය, 1922, පි. 248.

20. *දීඝනිකාය*, පි. 2.

21. *ථෙරගාථා*, සන්ධිකත්ථෙර ගාථා, බුද්ධ ජයන්ති මුද්‍රණාලය, 1972, පි. 80.

22. *සම්මෝහවිනොදනී*, යගිරල ප්‍රඥානන්ද ශෝධනය, කොළඹ: සයිමන් හේවාවිතාන ප්‍රකාශනය, 1932, පි. 245.

23. *දීපවංස*, සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන ප්‍රකාශනය, 1950, පි. 90.

24. *පාලි බෝධිවංසො*, සංස්. පදින්නොරුවේ ධම්මරතන හිමි, ලක්රිවිකිරණ මුද්‍රණාලය, 1890, පි. 99.

25. එම, පි. 99.

26. *ඌනපූරණ සහිතො මහාවංසො*, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන හා සමාගම, 1959, පරි. 10.